*සැ. යු.-* 2021.07.22 දින පළ වූ අංක 2238 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,239 - 2021 ජූලි මස 30 වැනි සිකුරාදා - 2021.07.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | — | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1594 |


සැ. යු. - (i) මානව හිමිකම් සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 ජූලි මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) බලන්ගොඩ ආනන්ද මෛත්‍රිය පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 ජූලි මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) සමාධි භාවනා හා යෝග මධ්‍යස්ථාන (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 ජූලි මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 අගෝස්තු මස 20 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 අගෝස්තු මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1591- B 82253— 5,403 (2021/07)
B-1

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය ඃ**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්ලූවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2021 සැප්තැම්බර්

2014.10.11 වැනි දින හා අංක 1883/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 08 වැනි වගන්තියේ සඳහන් පරිදි ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් II ශ්‍රේණියට උසස් කිරීමට පෙර, එනම් වසර දෙකක කාලයක් ඇතුළත හා දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් ස්ථිර කිරීමට පෙර එකී පත්වීම් දින සිට තෙවසරක කාලයක් ඇතුළත සමත් විය යුතු වන දෙපාර්තමේන්තු විභාගය 2021.09.12 වැනි දින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

02. *සුදුසුකම්* :

අදාළ විභාගය සම්පූර්ණ කර නොමැති, ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන්ට සහ පත්වීම ස්ථිර නොකරන ලද දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන්ට මෙම විභාගයට අයදුම් කළ හැක. තව ද, පූර්වයෙහි මෙම දෙපාර්තමේන්තු විභාගය සම්පූර්ණ නොකරන ලද වෛද්‍ය නිලධාරීන් පරිපාලන ශ්‍රේණියේ හෝ විශේෂඥ වෛද්‍ය ශ්‍රේණියේ තනතුරකට පත්කර ඇත්නම් එම නිලධාරීන්ට ද මෙම විභාගයට අයදුම් කළ හැක.

03. *අයදුම්පත්* :

මෙම චක්‍රලේඛ ලිපිය අවසානයේ දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා වෙත 2021.08.06 වැනි දින හෝ ඊට ප්‍රථම භාර දිය යුතුය. සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ බවට ආයතන ප්‍රධානීන් විසින් සහතික කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ (විභාග), සෞඛ්‍ය අමාත්‍යාංශය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, ''සුවසිරිපාය'' කොළඹ 10, යන ලිපිනයට 2021.08.12 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. සෑම අයදුම්පත්‍රයකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. තම අයදුම්පත සමඟ රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු. 45.00 ක් වටිනා මුද්දර ඇලවූ 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවර (02) ක් ද එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

***සැ. යු* : ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව, අයදුම්පත්‍රය A4 වර්ගයේ කඩදාසියක පළමු පිටුවේ අංක 1 සිට 4 (ඉ) දක්වාත් දෙවන පිටුවේ අංක 4 (ඊ) සිට අංක 9 දක්වාත් සකස් කළ යුතු ය. ඉහත ආකෘතියට අනුකූල නොවන සහ අසම්පූර්ණ සියලුම අයදුම්පත්‍ර නැවත දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

04. *විභාග ගාස්තු* :

(i) විභාගයට පළමු වරට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25 බැගින් අවලංගු නොකළ මුද්දර අයදුම්පත්‍රයේ අලවා තමන්ගේ අත්සන සහ දිනය යොදා ඒවා නිසිලෙස අවලංගු කළ යුතු ය.

(ii) කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

05. *විභාගයට ඇතුළත් කර ගැනීම* :

(i) පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(ii) විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළ දී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(*අ*) ජාතික හැඳුනුම්පත;
(*ආ*) සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ ඊට අදළ ආයතනයක් මගින් විධිමත් ලෙස නිකුත් කරන ලද හැඳුනුම්පත;
(*ඇ*) වලංගු රියදුරු බලපත්‍රය;
(*ඈ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

(iii) කිසියම් නොවැළැක්විය හැකි හේතුවක් මත විභාග ප්‍රවේශ පත්‍රය නොලැබුනහොත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවිය පරීක්ෂාකර මධ්‍යස්ථානය සහ විභාග අංකය සොයාගත හැකි ය. එසේ ඔබේ නමට අදාළ විභාග අංකය හා විභාග මධ්‍යස්ථානය සොයා ගත්තේ නම් ඔබේ ආසන්නතම ජ්‍යෙෂ්ඨ නිලධාරියා වෙතින් අත්සන සහතික කරන ලද ලිපියක් ද සමග වෙබ් අඩවියේ සඳහන්ව තිබූ විභාග මධ්‍යස්ථානයට පැමිණ ඔබේ අනන්‍යතාවය තහවුරුකර විභාගයට පෙනී සිටිය හැකිය. ප්‍රවේශ පත්‍ර ලැබුණු අයදුම්කරුවන් අත්සන සහතික කර රැගෙන පැමිණිය යුතුය. අත්සන සහතික කරන ලද ලිපිය හෝ ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවන් හට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

(වෙබ් අඩවිය-www. health. gov.lk)

06. *විභාග පරිපාටිය* :

මෙම විභාගය ලිඛිත, රචනා ප්‍රශ්න පත්‍ර තුනක් සහ සිංහල/දෙමළ වාචික පරීක්ෂණයක් වශයෙන් කොටස් හතරකින් සමන්විතය. එක් එක් කොටසක් සඳහා ලකුණු 100ක් බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා එක් කොටසකට අවම වශයෙන් ලකුණු 50 ක් ලබා ගත යුතු ය. එක් වරකදී හෝ කිහිප වරක දී කොටස් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකි ය. නිලධාරීන් විභාගයට පෙනී සිටින පළමු අවස්ථාවේ දී අදාළ සියලුම විෂයන්ට පෙනී සිටිය යුතු ය.

07. *විභාග විෂය නිර්දේශ මාලාව* :

07:1 **ලිඛිත විභාගය :**

07:1:1 **ආයතන සංග්‍රහය - ප්‍රශ්න පත්‍රය**
කාලය පැය 02 යි. ප්‍රශ්න 08 කින් ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතුය.

*විෂය නිර්දේශය* :

(i) සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පොදු රෙගුලාසි,

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රීති හා රෙගුලාසි,

(iii) ආයතන සංග්‍රහය :

I කොටස — VI, VII, VIII, IX, XII, XIII, XIV, XV, XVI, XVII, XVIII, XXIII, XXIV, XXV, XXVI, XXVII, XXVIII, XXX, XXXI, XXXII පරිච්ඡේදයන්,
II කොටස — XLVII සහ XLVIII යන පරිච්ඡේදයන්.

07:1:2 *රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය ප්‍රශ්න පත්‍රය* :
කාලය පැය 1 1/2 යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය.

*විෂයය නිර්දේශය* :
**සෞඛ්‍ය සේවා සංග්‍රහය -**

(i) රෝහල් හා මහජන සෞඛ්‍ය පරිපාලනය
(ii) රසායනාගාර සේවා කළමනාකරණය
(iii) ඖෂධ කළමනාකරණය

07:1:3 **ගිණුම් ප්‍රශ්න පත්‍රය** :
කාලය පැය 02 යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය.

*විෂයය නිර්දේශය* :

(i) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තොග කළමනාකරණය හා ගිණුම්කරණ රෙගුලාසි;
(ii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ලැබූ කළමනාකරණ අත් පොතෙහි මූල්‍ය කොටස;
(iii) වෛද්‍ය නිලධාරීන් සඳහා දෛනික පරිපාලන රාජකාරි සඳහා අදාළවන රාජ්‍ය මූල්‍ය රෙගුලාසි.

| | | |
|---|---|---|
| පරිච්ඡේද I | - | මු. රෙ. 1, 2, 78 |
| පරිච්ඡේද II | - | මු. රෙ 90, 91, 101, 102, 103, 104, 105, 106, 107, 108, 109, 110, 113, 115, 118, 119 |
| පරිච්ඡේද III | - | මු. රෙ 124, 125, 126, 127, 128, 131, 133, 134, 135, 136, 137, 138, 139, 140, 142, 143, 151, 152, 154, 155, 156, 189 |
| පරිච්ඡේද V | - | මු. රෙ 200, 201, 215, 225, 238, 245, 255, 257, 260 |
| පරිච්ඡේද VI | - | මු. රෙ 380, 381, 382, 383, 384, 385, 386, 388, 389, 390, 391, 392, 393, 394 |
| පරිච්ඡේද VII | - | මු. රෙ 488, 493 |
| පරිච්ඡේද XIII | - | මු. රෙ 715, 716, 756, 757, 758 |

**ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**

1 වැනි පරිච්ඡේදය - සියලුම වගන්ති.
2 වැනි පරිච්ඡේදය - 2.3, 2.4, 2.5, 2.6, 2.7, 2.8
3 වැනි පරිච්ඡේදය - 3.1, 3.2, 3.3, 3.4, 3.5, 3.6, 3.7, 3.8, 3.9

07:2 සිංහල/දෙමළ වාචික පරීක්ෂණය :

සිංහල/දෙමළ භාෂා ප්‍රවීනතාවය මැනීම සඳහා දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයකි. තමන්ගේ සාමාන්‍ය රාජකාරි කටයුතු කරගෙන යාමේදී පැන නගින කරුණු සම්බන්ධයෙන් සිංහල මාධ්‍ය නිලධාරීන්ට දෙමළ මාධ්‍යයෙන් ද, දෙමළ මාධ්‍ය නිලධාරීන්ට සිංහල මාධ්‍යයෙන් ද සන්නිවේදනය කිරීමට ඇති හැකියාව පරීක්‍ෂා කරනු ලැබේ. කාලය විනාඩි 10කි.

08. *විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම* :

අපේක්‍ෂකයින් විසින් වෙනත් අපේක්‍ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොළයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ ගෙන බලා උත්තර ලිවීම තහනම්ය. වෙනත් අපේක්‍ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීම ද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන් ද වැළකී සිටිය යුතුය. තවද ජංගම දුරකතන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්‍ෂකයෙකු දඬුවම් ලැබීමට යටත් වනු ඇත.

09. කරුණාකර මෙම චක්‍රලේඛයේ අඩංගු දෑ ඔබ ආයතනයේ සේවයෙහි නියුතු අදාළ නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න.

මෙම තොරතුරු www.health. gov.lk වෙබ් අඩවියේ ද ඇතුළත් කර ඇත.

*සැ. යු.*- මෙම චක්‍රලේඛයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවයන් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත්වේ.

වෛද්‍ය එස්. එච්. මුණසිංහ,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2021 ජූලි මස 20 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
''සුවසිරිපාය''
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**ආදර්ශ අයදුම්පත**

**ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2021 සැප්තැම්බර්**

01 (අ) (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) :————.

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

(iii) මුල'කුරු සමග නම (සිංහලෙන්) :————.

(iv) මුල'කුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

(ආ) (i) නිල නාමය (අදාළ කොටුව තුළ ( ✓ ) ලකුණ යොදන්න.

I වෛද්‍ය නිලධාරි : II දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි :

(ii) සීමාවාසික පත්වීම ලද දිනය :————.

(iii) ප්‍රාථමික ශ්‍රේණියට / II ශ්‍රේණියට පත්වීම ලද දිනය :————.

02. ඔබ මෙවර විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන විෂයන් ඉදිරියේ ඇති කොටුව තුළ (✓) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (x) ලකුණ යොදන්න.

රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය : ආයතන සංග්‍රහය : ගිණුම් :

සිංහල වාචික : දෙමළ වාචික :

03. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (අදාළ කොටුවේ (✓) හරි ලකුණ යොදන්න.) :

සිංහල : ඉංග්‍රීසි : දෙමළ :

04. (අ) (i) දැනට සේවය කරන ආයතනය (පැහැදිලිව සඳහන් කරන්න.) :————.

(ii) මෙම ආයතනය අයත් වන්නේ -

රේඛීය අමාත්‍යාංශයට :

පළාත් සභාවට :

(ආ) (i) පළාත් සභාවට නම් අදාළ පළාත :————.
(ii) එය අයත් දිස්ත්‍රික්කය :————.

(ඇ) ජංගම දුරකතන අංකය : | | | | | | | | | | |

(ඈ) ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

(ඉ) පහත දක්වා ඇති මධ්‍යස්ථාන අතුරින් විභාගයට පෙනී සිටීමට කැමැති විභාග මධ්‍යස්ථානයට අදාළ කොටුවේ (✓) හරි ලකුණ යොදන්න. (දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයක් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති නම් හෝ දක්වා ඇති මධ්‍යස්ථාන එකක් හෝ කිහිපයක් අවලංගු කරනු ලබන අතර එකී මධ්‍යස්ථානයට අයදුම් කරනු ලැබූ අයදුම්කරුවන් ආසන්නතම විභාග මධ්‍යස්ථානයකට හෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් තීරණය කරනු ලබන වෙනත් විභාග මධ්‍යස්ථානයකට අනුයුක්ත කරනු ලැබේ.)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | | කඳාන | | හම්බන්තොට | | අම්පාර | |
| කළුතර | | ගාල්ල | | බදුල්ල | | වව්නියාව | |
| කුරුණෑගල | | අනුරාධපුර | | රත්නපුර | | පොළොන්නරුව | |
| මහනුවර | | මඩකලපුව | | යාපනය | | ත්‍රිකුණාමලය | |

(ඊ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා පැහැදිලිව ලිපිනය ලියන ලද 9" x 4" ප්‍රමාණයේ රුපියල් 45.00 ක මුද්දර ඇලවූ ලියුම් කවර 02ක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේ ද? :————.

(උ) (i) තැපැල් ලිපිනය (සිංහලෙන්) :————.

(ii) තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේ ද ? :————.
(ආ) විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් මුද්දර අලවා තිබේ ද? :————.

| මුද්දර කොටුව (මුද්දර අලවා ඒ මත අත්සන තබන්න.) |
|---|

06. *අයදුම්කරුගේ සහතිකය* :

මගේ දැනුම හා විශ්වාසය පරිදි —

(i) මෙම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත්, මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්, ප්‍රථම වතාවට නොවන බැවින් රු ..... ක් වටිනා මුද්දර අලවා ඇති බවත් මෙම ඉල්ලුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(ii) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීතිවලට එකඟව ක්‍රියාකිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මාගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟවන බවත් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

07. *පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියාගේ/නිලධාරිණියගේ සහතිකය :*

මෙම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පෙර මා වෙත භාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණකර ඇති බවත්, මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපි ගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

—————,
නම සහ අත්සන.

දිනය :—————.

08. *ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

.......................... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවයේ නියුතු වෛද්‍ය නිලධාරියකු/දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියකු වන අතර, අයදුම්පත්‍රයෙහි දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට වන/නොවන බවට ද රු.................. ක් වටිනා මුද්දර මෙම මුද්දර අයදුම්පත්‍රයට අලවා ඇති බව ද/මුද්දර ඇලවීමට අනවශ්‍ය බවට ද මා ඉදිරිපිට දී අත්සන් කළ බව ද සහතික කරමි.

—————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.
(රබර් මුද්‍රාව තැබිය යුතුය)

දිනය :—————.

09. *විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය :*

.......................... මහතා/මහත්මිය/මෙනවිය වෛද්‍ය නිලධාරියකු/ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියකු වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පත්‍රයෙහි දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

—————,
විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන.
(රබර් මුද්‍රාව තැබිය යුතුය).

දිනය :—————.

(අනවශ්‍ය කොටස් කපා හරින්න)

07-739

---

## ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III ශ්‍රේණියට සීමිත පදනමින් බඳවා ගැනීමේ තරග විභාගය - 2021

ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III ශ්‍රේණියේ තනතුරුවල පවත්නා පුරප්පාඩු මත සීමිත පදනමින් බඳවා ගැනීමේ තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතේ අයදුම්කරුගේ අත්සන සහතික කර ආයතන ප්‍රධානියාගේ සහතිකය සමග අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස ඉහළ කෙළවරේ "**ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III ශ්‍රේණියට සීමිත පදනමින් බඳවා ගැනීමේ තරග විභාගය - 2021**" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2021 අගෝස්තු මස 23 වැනි දින** පැය 24:00 වේ.

මෙම විභාගයේ පළමු කොටස රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන නියමයන්ට යටත්ව, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2021 සැප්තැම්බර් හෝ ඔක්තෝබර් මස කොළඹ දී පමණක් පවත්වනු ඇත. රට තුළ උද්ගතවිය හැකි විශේෂ තත්ත්වයක් මත පමණක් විභාගය දිවයින පුරා පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. එතකුදු වුවත් කිසියම් විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කර නොමැති අවස්ථාවක දී එම මධ්‍යස්ථානයට මනාපය පළ කර ඇති අයදුම්කරුවන් වෙනත් විභාග මධ්‍යස්ථානයකට යොමු කරනු ලැබේ (මේ පිළිබඳ වැඩිමනත් විස්තර

අයදුම්පතේ සඳහන් කර ඇත). රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමයන්ට යටත්ව මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට විභාග කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

*සටහන* : අයදුම්පතේ මුද්‍රිත පිටපත ලියාපදිංචි තැපැල් මගින් එවීම අනිවාර්ය වන අතර, එය තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතු ය.

1. මෙම නිවේදනයේ "පත්කිරීම් බලධරයා'' යනුවෙන් අදහස් කරනුයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව ද, "සේවය'' යන පදයෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය ද වේ .

2. *බඳවා ගැනීමේ ක්‍රමය* :

2.1. *ලිඛිත විභාගය* .- දීප ව්‍යාප්ත සේවාවන් සහ රාජ්‍ය සේවයේ විධායක ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ පොදු තරග විභාගය මෙයට අදාළ වේ. මෙම තරග විභාගය පහත සඳහන් පරිදි කොටස් දෙකකින් සමන්විතය. පළමු කොටසේ (පොදු කොටස) එක් එක් ප්‍රශ්න පත්‍රයෙන් 40% හෝ ඊට වැඩි සහ මුළු ලකුණු ප්‍රමාණය 100ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් දෙවන කොටස සඳහා කැඳවනු ලැබේ.

*පළමු කොටස (පොදු කොටස)* :

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 1 1/2 | 100 | 40 |
| 2. අවබෝධය | පැය 02 | 100 | 40 |

*දෙවන කොටස*

| *සේවය* | *විෂය අංකය* | *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් වීම ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 21 | මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණය | පැය 03 | 100 | 40 |
| | 22 | උසස් විගණනය හා ආර්ථික විශ්ලේෂණය | පැය 03 | 100 | 40 |

2.2. සම්මුඛ පරීක්ෂණය .- ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතරින් සෑම ලිඛිත ප්‍රශ්න පත්‍රයක් සඳහාම නියමිත ලකුණුවලින් යටත් පිරිසෙයින් 40% ක් හෝ ඊට වැඩි ලකුණු ලබාගත් අයදුම්කරුවන් පමණක් ලබා ඇති ලකුණු කුසලතා අනුපිළිවෙළ අනුව සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, එම සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි තීරණය කරනු ඇත. ලිඛිත විභාගයේ දී ලබා ඇති මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ මත රජයේ විධායක නිලධර ගණයේ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියේ සීමිත පදනමින් පවත්නා පුරප්පාඩු සඳහා පත්කිරීමට තෝරා ගනු ලැබේ.

3. මෙම විභාගය මගින් සීමිත පදනමින් සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරන පුරප්පාඩු සංඛ්‍යාව 101 කි. මෙම තනතුර සඳහා පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය අනුව තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ල පිරවීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත. අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසාන පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවකදී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳ තීරණය කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 80 වන වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙනු ලැබේ.

4. *බඳවා ගැනීමේ සුදුසුකම්* :

(අ) i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම;
ii. විශිෂ්ට චරිතයකින් යුක්ත වීම;
iii. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත වීම;

(ආ) *අධ්‍යාපන/වෘත්තීය/පළපුරුද්ද සඳහා වූ සුදුසුකම්* :

i. පහත කවර හෝ සුදුසුකමක් සහිතව අයදුම්පත් කැඳවීමේ නිවේදනය ප්‍රකාශයට පත් කරන දිනට රජයේ/ පළාත් රාජ්‍ය සේවයේ වසර 05කට නොඅඩු සතුටුදායක, අඛණ්ඩ, ස්ථිර සේවා කාලයක් සහිත අදාළ දිනට අවම වශයෙන් වැටුප් වර්ධක 5ක් උපයාගෙන තිබීම.

*a.* විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වාණිජ්‍යය, කළමනාකරණ, ගණකාධිකරණ, ආර්ථික විද්‍යා යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළ උපාධියක් ලබා තිබීම ;

හෝ

*b.* ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ/ශ්‍රී ලංකා උසස් කාර්මික අධ්‍යාපන ආයතනයේ /ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ උසස් ඩිප්ලෝමාලාභියෙකු හෝ උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමාලාභියෙකු විය යුතු ය ;

*හෝ*

*c.* ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක වරලත් ගණකාධිකාරී ආයතනයක ආවසරික II හෝ අන්තර් මාධ්‍ය පරීක්ෂණය හෝ ගිණුම්කරණය හා ව්‍යාපාර සහතිකය II හෝ ව්‍යාපාර අදියර විභාගය හෝ ආයතනික අදියර විභාගය හෝ ඊට වඩා ඉහළ පරීක්ෂණයකින් හෝ සමත්වී සිටිය යුතුය;

*හෝ*

*d.* එක්සත් රාජධානියේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක වරලත් කළමනාකරණ ගණකාධිකාරීත්ව ආයතනයක් මගින් පවත්වන පිරිවැය සහ කළමනාකරණ පරීක්ෂණයේ I හා II වැනි කොටස් හෝ අන්තර් මාධ්‍ය පරීක්ෂණය හෝ ඊට වඩා ඉහළ පරීක්ෂණයකින් හෝ සමත් වී සිටිය යුතුය;

*හෝ*

*e.* එක්සත් රාජධානියේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ ගණකාධිකරණ ආයතනයේ I වැනි වෘත්තීය මට්ටමේ හෝ වඩා උසස් මට්ටමක පරීක්ෂණයකින් සමත් වී සිටිය යුතුය ;

*හෝ*

*f.* එක්සත් රාජධානියේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ වරලත් සංගමයේ I වැනි සහ II වැනි කොටසට අයත් පරීක්ෂණය හෝ ඊ ඉහළ පරීක්ෂණයකින් සමත් වී සිටිය යුතුය ;

*හෝ*

*g.* එක්සත් රාජධානියේ ලේකම්වරුන්ගේ හා පරිපාලකයින්ගේ වරලත් ආයතනයේ අවසාන පරීක්ෂණය සමත් වී සිටිය යුතුය.

*හෝ*

*h.* ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ කළමනාකරණ මට්ටම හෝ ඊට වඩා ඉහළ මට්ටමක පරීක්ෂණයකින් සමත්වී සිටිය යුතුය.

*හෝ*

(ii) රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත MN 1-2006 (ඒ) දරන වැටුප් පරිමාණය හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයක් හිමි තනතුරක වසර 10කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා අදාළ දිනට වැටුප් වර්ධක 10ක් අවම වශයෙන් උපයාගෙන තිබීම.

(ඇ) *සුදුසුකම් පිළිබඳ සීමා* :

i. මෙම විභාගය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ *ගැසට්* නිවේදනය ප්‍රකාශයට පත් කරන දිනට හෝ ඊට පෙර වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

ii. කුමන හෝ ආගමක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට මෙම තරග විභාගයට අයදුම් කිරීමට හෝ පෙනී සිටීමට හෝ අවසර නොමැත.

iii. අයදුම්කිරීමට සුදුසුකම් ලැබීමට පූර්වාසන්නයෙන් වූ වසර පහක කාලසීමාව තුළ නියමිත දිනයන්හි දී සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය.

iv. සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

v. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට බඳවා ගැනීම සඳහා පැවති සීමිත තරග විභාග (උතුරු සහ නැගෙනහිර පළාත් සඳහා පවත්වන විශේෂ සීමිත තරග විභාගය ඇතුළුව) වාර දෙකකට වඩා පෙනී සිටීමට කිසිදු තැනැත්තෙකුට අවසර නොමැත.

vi. සේවයට පත්කිරීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලැබීමට අයදුම්කරු, 4 ඡේදයෙහි සඳහන් සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ *ගැසට්* නිවේදනය ප්‍රකාශයට පත් කරන දිනට හෝ ඊට පෙර සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

5. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි* :

5.1. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, අංක 1670/33 සහ 2010 සැප්තැම්බර් 10 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද අංක 1589/30 සහ 2009.02.20 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීතිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ.

5.2. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තව ද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු

පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

*සටහන.*-2016.01.01 දිනෙන් පසුව රාජ්‍ය සේවයේ තනතුරකට පත්ව ඇති නිලධාරීන්, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතු වේ.

5.3. බඳවා ගන්නා නිලධාරීන් එක් අවුරුදු වැඩබැලීමේ කාලයකට යටත්ය. බඳවා ගැනීමෙන් වසර 03ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

5.4. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020ට අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා/ රාජ්‍ය භාෂාවන්හි ප්‍රවීණතාව ලබා ගත යුතුය.

5.5. දිවයින තුළ නියම කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා වාර්තා කළ යුතුය.

5.6. තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරී භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි බලය ඇත.

6. *වැටුප් ව්‍යුහය හා මාසික වැටුප් පරිමාණය* :

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරුවලට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 47,615 - 10 x 1,335 - 8 x 1630 - 17 x 2,170 - 110,895/- (SL I - 2016) වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමිවේ.

7. *විභාග කොන්දේසි* :

I. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය-වලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂා මාධ්‍යයකින් විභාගයට පෙනී සිටිය හැකිය. අපේක්ෂකයන් මෙම විභාගය සඳහා තමා විසින් අයදුම් කරනු ලබන සේවාවන්ට අදාළ සියලු ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුතු අතර ඒ සඳහා එක් භාෂා මාධ්‍යයක් පමණක් තෝරා ගත යුතු ය. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි සඳහන් කරනු ලබන විභාග මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

II. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපතට අමතරව ලියාපදිංචි තැපෑලෙන් මුද්‍රිත පිටපතක්ද යොමු කළ යුතුය. මෘදු පිටපත සහ මුද්‍රිත පිටපත (printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු සත්‍යාපනය කිරීම (verify) සිදු කරනු ලබන අතර වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව /භාර නොගන්නා බව ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instruction) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේදී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් පසුව කරනු ලබන විමසීම් වලදී ඉදිරිපත් කිරීමට ළඟ තබා ගත යුතුය. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

III. මෙම විභාගයේ පළමු කොටසේ විභාග ගාස්තුව රු. 1000 (දහස) කි. දෙවන කොටස සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට රු. 300 (තුන් සියය) කි. දෙවන කොටස සඳහා විභාග ගාස්තු ගෙවිය යුත්තේ පළමු කොටස සමත්වීමෙන් අනතුරුවය. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේදය යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

(i) ඕනෑම බැංකුවක ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card),
(ii) අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකුවක හර කාඩ්පතක් මගින් (Bank Debit Card with Internet Payment Facility),
(iii) ලංකා බැංකු ඔන්ලයින් බැන්කින් ක්‍රමය මගින් (Bank of Ceylon Online Banking Bill Payment Method),
(iv) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon any Branch),
(v) තැපැල් දෙපාර්තමේන්තුවේ තැපැල් කාර්යාලයක් මගින් (Postal Department Payment at a Post Office).

*සටහන* .- ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

IV. ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් දන්වනු ලැබේ. විභාගයේ දෙවන කොටස සඳහා විභාග ගාස්තු ගෙවීමේදී අපේක්ෂකයා අයදුම් කරන ලද සියලු සේවාවන් සඳහා නියමිත ප්‍රශ්න පත්‍ර සියල්ලටම එක් ප්‍රශ්න පත්‍රයකට රුපියල් 300/- (තුන්සියයක්) බැගින් ගෙවිය යුතුය. මෙම මුදල ගෙවිය යුත්තේ විභාගයේ පළමු කොටස සමත් වීමෙන් පසුව දෙවන කොටසට අදාළ ප්‍රවේශ පත්‍රය ලබා ගැනීමේදීය. අදාළ වන පරිදි නියමිත මුදලම ගෙවිය යුතු අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන්

ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

V. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිදු හේතුවක් මත ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම සිදු කරනු නොලැබේ.

VI. අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශපත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතුය.

***සටහන.-*** ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය පමණි. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

VII. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට අයදුම්පතේ මුද්‍රිත පිටපත එවා ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත හා අයදුම්පතේ මුද්‍රිත පිටපත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීමද ප්‍රයෝජනවත් වනු ඇත.

***සටහන.-*** ලිඛිත විභාගයේ පළමු කොටසේ (පොදු කොටස) එක් එක් ප්‍රශ්න පත්‍රයෙන් 40% හෝ ඊට වැඩි සහ මුළු ලකුණු ප්‍රමාණය 100ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබන අයදුම්කරුවන් සඳහා පමණක් දෙවන කොටස (අදාළ සේවාවට විශේෂ වන කොටස) සඳහා නැවත ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ලැබේ.

VIII. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

IX. විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරින්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

X. විවෘත පදනම හා සීමිත පදනම මත පවත්වනු ලබන තරග විභාග දෙක සඳහාම පෙනී සිටීමට නියමිත අයදුම්කරුවන් සඳහා

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියට සීමිත පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්කරනු ලබන අයදුම්කරුවන් හා විවෘත පදනම මත බඳවා ගැනීම සඳහා ඉල්ලුම් කරනු ලබන අයදුම්කරුවන් පෙනී සිටිය යුතු වන්නේ එකම විභාගයක් සඳහා වන බැවින්,

i. අංක 2,234 දරන හා 2021.07.16 දිනැති *ගැසට් පත්‍රයේ* පළකර ඇති දීප ව්‍යාප්ත සේවාවන් සහ රාජ්‍ය සේවයේ විධායක ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ පොදු තරග විභාගය - 2021 යටතේ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විවෘත බඳවා ගැනීම සඳහා ද අයදුම්කරන අයදුම්කරුවෙකු ප්‍රථමව එම අයදුම්පත ඉදිරිපත් කර, ඒ සඳහා

ලැබෙන යොමු අංකය මෙම අයදුම්පත හි අංක 2.0 හි ඇතුළත් කළ යුතුය.

ii. අයදුම්පත හි අංක 2.0 හි එම කේත අංකය ඇතුළත් කර නොමැති අයදුම්කරුවකු ඉහත ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විවෘත බඳවා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති අයදුම්පතක් වේ නම් එයින්ම එය අවලංගු වන අතර විවෘත බඳවා ගැනීමේ විභාගය සඳහා විභාග ප්‍රවේශපත්‍රයක් ලැබුණ ද එවැනි අයෙකුගේ එම විභාගය සඳහා වූ විභාග අපේක්ෂකත්වය අවලංගුව ඇති ලෙස සලකා කටයුතු කරනු ලැබේ.

iii. විවෘත බඳවා ගැනීම සඳහා ලබා දෙන කේත අංකය සුරක්ෂිතව තබා ගැනීම අයදුම්කරුවන් ගේ වගකීම වේ.

8. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :*

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කරනු ලැබේ.

පත්වීම් ලබා ගැනීමෙන් පසුව ඉහත සඳහන් කරුණු පිළිබඳව අනාවරණය වුවහොත්, අදාළ පත්වීම යටතේ වැටුප් හා දීමනා ලෙස රජය/පළාත් සභා විසින් ගෙවා ඇති සියලු මුදල් ආපසු අය කර ගනු ලැබේ.

9. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභා විසින් තීරණය කරනු ලැබේ.

10. *විභාග මාධ්‍යය :*

(අ) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.
(ආ) විභාගයට පෙනී සිටින ලද මාධ්‍යය පත්වීම් මාධ්‍යය ලෙස සලකනු ලැබේ.
(ඇ) අපේක්ෂකයකු විභාගයේ දී පෙනී සිටින සියලු ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.
(ඈ) තම අයදුම්පතෙහි සඳහන් විභාග භාෂා මාධ්‍යය වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ.

11. *විභාග ක්‍රමය, සම්මුඛ පරීක්ෂණ හා පත්කිරීම :*

11.1.ලිඛිත විභාගය

11.1.1. පළමු කොටස (පොදු කොටස)

| *ප්‍රශ්න පත්‍රය* | *විෂය නිර්දේශය* | *ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය* |
|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයා සතු තර්කනය, ආදේශනය, අර්ථකථනය, සම්බන්ධතා දැකීම, පරිවර්තනය, ගැටලු විසඳීමේ හැකියාව, හේතුඵල සම්බන්ධතා අවබෝධ කර ගැනීම, පුරෝකථනය, තොරතුරු සංවිධානය, රටා හඳුනාගැනීම සහ උපදෙස් පිළිපැදීම ආදී හැකියා මැනීම සඳහා සකස් කරනු ලබන බහුවරණ වර්ගයේ ප්‍රශ්නවලින් යුක්ත වේ. | බහුවරණ ප්‍රශ්න සහ/හෝ කෙටි ප්‍රශ්න 50 කින් සමන්විත වේ.<br>ලකුණු 100<br>කාලය පැය 1 1/2 |
| 2. අවබෝධය | අපේක්ෂකයා සතු කරුණු අවබෝධ කර ගැනීමේ හැකියාව, සන්නිවේදන කුසලතා, සාරාංශකරණය, විවරණය හා නිර්මාණාත්මක බව ආදී කුසලතා මැනීම සඳහා සකස් කරනු ලබන වාස්තවික ප්‍රශ්නවලින් යුක්ත වේ. | බහුවරණ ප්‍රශ්න සහ/හෝ කෙටි ප්‍රශ්න 50 කින් සමන්විත වේ.<br>ලකුණු 100<br>කාලය පැය 02 |

11.1.2. දෙවන කොටස

සෑම අයදුම්කරුවකුම මෙම විශේෂ කොටසේ ප්‍රශ්න පත්‍ර සියල්ලටම පෙනී සිට සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම අවම ලකුණු 40ක් ලබා තිබිය යුතුය.

(I) ප්‍රශ්න පත්‍ර ව්‍යුහය ඃ

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය* |
|---|---|---|
| මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණය | පැය 03 | ලකුණු 100, සමත් අවම ලකුණ 40 යි.<br>ප්‍රශ්න පත්‍රය කොටස් 02 කින් සමන්විත වේ)<br>(I කොටස සඳහා වන ලකුණු ප්‍රමාණය 60 කි<br>II කොටස සඳහා වන ලකුණු ප්‍රමාණය 40 කි) |
| උසස් විගණනය හා ආර්ථික විශ්ලේෂණය | පැය 03 | ලකුණු 100, සමත් අවම ලකුණ 40 යි.<br>ප්‍රශ්න පත්‍රය කොටස් 02 කින් සමන්විත වේ)<br>(I කොටස සඳහා වන ලකුණු ප්‍රමාණය 60 කි<br>II කොටස සඳහා වන ලකුණු ප්‍රමාණය 40 කි) |

(II) විෂය නිර්දේශය ඃ

මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණය -
(මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 02 කින් යුක්ත වන අතර ප්‍රශ්න 08 කින් සමන්විත වේ )

I *කොටස - මූල්‍ය ගණකාධිකරණය* ඃ

මෙම කොටස ප්‍රශ්න පහකින් (05) සමන්විත වේ. පළමු වන ප්‍රශ්නය අනිවාර්යය වන අතර ඉතිරි ප්‍රශ්න හතරෙන් (04) දෙකක් (02) තෝරාගත යුතුය. සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ප්‍රමාණයක් හිමිවේ.

1. අනිවාර්යය ප්‍රශ්නය ඃ

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වල භාවිතය පිළිබඳ අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කෙරේ. මෙම ප්‍රශ්නයට අනු කොටස් පහක් ඇති අතර සෑම කොටසකටම ලකුණු 04ක් හිමිවේ.

මෙම ප්‍රශ්නය යටතේ පහත දැක්වෙන ශ්‍රී.ලං.ගි.ප්‍රමිත ආවරණය කරනු ලැබේ.

- මූල්‍ය ප්‍රකාශන - ශ්‍රී.ලං.ගි.ප්‍ර.1
- දේපළ, පිරියත හා උපකරණ - ශ්‍රී.ලං.ගි.ප්‍ර.16
- අයභාරය-ශ්‍රී.ලං.ගි.ප්‍ර. 18
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය - ශ්‍රී.ලං.ගි.ප්‍ර. - 7
- තොග - ශ්‍රී.ලං.ගි.ප්‍ර.2
- ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් හා වැරදි - ශ්‍රී.ලං.ගි.ප්‍ර.8
- වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු සිද්ධි - ශ්‍රී.ලං.ගි.ප්‍ර.10
- කල්බදු - ශ්‍රී.ලං.ගි.ප්‍ර.17
- ආදායම් බදු - ශ්‍රී.ලං.ගි.ප්‍ර12
- ප්‍රතිපාදන, අසම්භාව්‍ය වත්කම් හා අසම්භාව්‍ය වගකීම් - ශ්‍රී.ලං.ගි.ප්‍ර.37
- මූල්‍ය උපකරණ - ශ්‍රී.ලං.ගි.ප්‍ර.39

2. මූල්‍ය ප්‍රකාශ සඳහා සංකල්පමය හා නියාමන ආකෘති රාමුව

පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශවල අරමුණු, යොදාගන්නා වූ උපකල්පන, මූල්‍ය ප්‍රකාශවල ගුණාත්මක ලක්ෂණ, මූල්‍ය ප්‍රකාශවල මූලිකාංග, මූල්‍ය ප්‍රකාශවල මූලිකාංග හඳුනාගැනීම හා මිනුම් කිරීම, ප්‍රාග්ධන හා ප්‍රාග්ධන නඩත්තු කිරීමේ සංකල්ප, ආයතනික පාලනයට අදාළ විධිවිධාන, සමාගම් පනත සහ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ රෙගුලාසි හා නීති

3. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ ඇතුළු සීමිත වගකීම් සමාගම්වල මූල්‍ය ප්‍රකාශ

වගකීමෙන් සීමිත සමාගමක් සඳහා ඇති අරමුදල් මූලාශ්‍ර හඳුනාගැනීම, කොටස් හා ණයකර නිකුත් කිරීම හා නිදහස් කිරීම සඳහා ලෙජර් ගිණුම් පිළියෙල කිරීම, කළමණාකාරීත්වයේ කාර්යන් සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා පළ කිරීම.

4. ලාභ නොලබන සංවිධාන සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම

5. මූල්‍ය ප්‍රකාශ විශ්ලේෂණය, මූල්‍ය ප්‍රතිඵල අර්ථනිරූපණය හා සන්නිවේදනය කිරීම හා මූල්‍ය නොවන වාර්තාකරණය

*II කොටස - කළමනාකරණ ගණකාධිකරණය* :

මෙම කොටස පහත කරුණු ආශ්‍රයෙන් සකස්කරන ලද ප්‍රශ්න 03 කින් සමන්විත වන අතර ප්‍රශ්න 02 කට පිළිතුරු සැපයිය යුතුය. සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ප්‍රමාණයක් හිමිවේ.

1. පිරිවැය ගිණුම්කරණයේ අංග
   පිරිවැය වර්ගීකරණය, පිරිවැය හැසිරීම, ඇස්තමේන්තුගත කිරීම, ද්‍රව්‍ය හා තොග පාලනය , ශ්‍රම පිරිවැය, නිශ්චිත හා අඛණ්ඩ ඇණවුම් පිරිවැය

2. පිරිවැය ගිණුම්කරණ ක්‍රම
   අන්තර්ග්‍රහණ පිරිවැයකරණය හා ආන්තික පිරිවැයකරණය, ක්‍රියාකාරකම් පාදක පිරිවැයකරණය, ක්‍රියාවලි පිරිවැයකරණය, ප්‍රතිදාන ගිණුම්කරණය, නූතන කළමනාකරණ ගිණුම්කරණය

3. ව්‍යාපාර සඳහා මූල්‍ය ගණිතය හා ව්‍යාපෘති ඇගයීම් මූලිකාංග සංයෝග, වට්ටම් කිරීම

4. ප්‍රමිත පිරිවැයකරණය හා විචලතා විශ්ලේෂණය

5. ව්‍යාපාර කටයුතු සඳහා ගණිතය

6. අයවැයකරණය හා පුරෝකථනය
   අයවැයකරණය, අයවැය පිළියෙල කිරීම හා අයවැය පාලනය කිරීම

7. අවිනිශ්චිතතාව යටතේ තීරණ ගැනීම
   කෙටිකාලීන හා දිගුකාලීන තීරණ ගැනීම සඳහා වන තොරතුරු, පිරිවැය - පරිමා - ලාභ විශ්ලේෂණය, වැඩිදුර විස්තීර්ණ සැකසීම් මිලකරණය, බහුවිධ අවහිරතා යටතේ තීරණ ගැනීම

8. කාරක ප්‍රාග්ධන කළමනාකරණය

උසස් විගණනය හා ආර්ථික විශ්ලේෂණය —
(මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 02 කින් යුතු අතර, ප්‍රශ්න 08 කින් සමන්විත වේ.)

I කොටස - උසස් විගණනය

මෙම කොටස පහත කරුණු ආශ්‍රයෙන් සකස් කරන ලද ප්‍රශ්න 05 කින් සමන්විත වන අතර ප්‍රශ්න 03 කට පිළිතුරු සැපයිය යුතුය. සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ප්‍රමාණයක් හිමිවේ.

1. *විවිධ විගණන විධි හා එම විගණනයන්වල අරමුණු* :
   මූල්‍ය විගණනය, පද්ධති විගණනය, අනුකූලතා විගණනය, මුදලට අගය විගණනය, කාර්යසාධන විගණනය, ව්‍යවහාරික විගණනය, අභ්‍යන්තර විගණනය, බාහිර විගණනය, කළමනාකරණ විගණනය යනාදිය

2. *විගණන සැලසුම්කරණය හා පාලනය* :
   විගණන සැලසුම්කරණය, කාල නිශ්චය, අන්තර් හා අවසන් විගණනය, කාර්යන් සඳහා වගකීම් පැවරීම, අභ්‍යන්තර පාලනයේ භාවිතය ඇතුළු සිදුකරන ලද කටයුතු වාර්තා කිරීම, අභ්‍යන්තර පාලනය ඇගයීම සඳහා ප්‍රශ්නාවලි හා ආකෘති පත්‍ර පිළියෙල කිරීම.

3. *වෘත්තීමය හැසිරීම හා ආචාර ධර්ම :*
අවංක බව, ඒකරාශී වීමේදී දක්වන විෂය මූලිකභාවය, විගණන කටයුතු පිළිබඳ තොරතුරු ඇගයීම හා තොරතුරු සන්නිවේදනය කිරීම, තොරතුරුවල රහසිගතභාවය, වෘත්තීමය බැඳියාව, දැනුම, කුසලතා හා පළපුරුද්ද යොදා ගැනීමේ දක්ෂතාව

4. *නෛතික අයිතිය හා වගකීම් :*
ගණකාධිකාරීවරුන්ගේ හා විගණකවරුන්ගේ නීතිමය වගකීම් හා අදාළ නීතිමය විධිවිධාන

5. *අවදානම් තක්සේරු කිරීමේ ශිල්පක්‍රම හා කළමනාකරණය :*
විවිධ අවදානම් වර්ග, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය, අවදානම් කළමනාකරණ ශිල්ප ක්‍රම හා උපකරණ හඳුනා ගැනීම

6. *විගණන ප්‍රමිතීන් :*
අන්තර්ජාතික විගණන ප්‍රමිති (ISAs) හා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් (SLAuSs)

7. *අභ්‍යන්තර විගණනයේ කාර්යන් :*
අභ්‍යන්තර විගණනයේ කාර්යන් හා අභ්‍යන්තර විගණනයේ අරමුණු හඳුනාගැනීම, විගණන කමිටු

8. *සාක්ෂි රැස්කිරීම :*
සාක්ෂි එකතු කිරීමේ විවිධ ක්‍රම හා සාක්ෂි එකතු කිරීමේ ක්‍රියාවලි
හඳුනාගැනීම, සාක්ෂිවල වලංගුභාවය සහතික කිරීම

9. *වාර්තාකරණ කාර්යන් :*
වාර්තා වර්ග, වාර්තාකරණ ප්‍රමිතීන්, ව්‍යුහයන්, වාර්තා කිරීමේ ක්‍රියාවලිය, විගණන මත හා පසු විපරම් ක්‍රියාවලි යනාදිය.

II *කොටස - ආර්ථික විශ්ලේෂණය :*

පහත කරුණු ආශ්‍රයෙන් සකස් කරන ලද ප්‍රශ්න 03 කින් මෙම කොටස සමන්විත වන අතර ඉන් ප්‍රශ්න 02 කට පිළිතුරු සැපයිය යුතුය. සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ප්‍රමාණයක් හිමිවේ.

1. *සාර්ව ආර්ථික විචල්‍යයන් අවබෝධ කර ගැනීම :*
සාර්ව ආර්ථික විචල්‍යයන් හා ප්‍රධාන දර්ශක, සාර්ව ආර්ථික විචල්‍යයන් තක්සේරු කිරීමේ අරමුණ, සාර්ව ආර්ථික විචල්‍යයන් අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධතා සහ ශ්‍රී ලංකාවේ වර්තමාන සන්දර්භය හඳුනාගැනීම.

2. *ජාතික ආදායම් නිශ්චය කිරීම හා ජාතික ආදායම් ගිණුම්කරණය :*
ජාතික ආදායම් මැනීමේ ක්‍රම, ජාතික ආදායමේ ආංශික දායකත්වය, ප්‍රාග්ධන පරිභෝජනය සහ ප්‍රාග්ධන පරිභෝජන ගැළපුම්, රාජ්‍ය පරිභෝජනය සහ පෞද්ගලික පරිභෝජනය, ජාතික නිෂ්පාදන හා සුභසාධනය සහ වර්තමාන ශ්‍රී ලංකා සන්දර්භය

3. *අන්තර්ජාතික වෙළඳාම හා ආර්ථික සංවර්ධනය :*
අන්තර්ජාතික වෙළඳ න්‍යාය, අන්තර්ජාතික වෙළඳාම හා ආර්ථික සංවර්ධනය, ගෙවීම් හා විනිමය අනුපාතයේ හැසිරීම තුලනය කිරීම සහ වර්තමාන ශ්‍රී ලංකා සන්දර්භය

4. විදේශ මූල්‍ය, විදේශ සෘජු ආයෝජන, සංවර්ධනය වන රටවල ණය, තිරසර ණය කළමනාකරණය සහ වර්තමාන ශ්‍රී ලංකා සන්දර්භය

5. ප්‍රාග්ධන හා මූල්‍ය වෙළඳපොළ, මූල්‍ය අතරමැදියන් හා මූල්‍ය උපකරණ

6. මුදල් ප්‍රතිපත්තිය

7. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය

11.2. සම්මුඛ පරීක්ෂණය

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පමණක් පැවැත්වෙන අතර පොදු කොටසේ සහ විශේෂිත කොටසේ සෑම ලිඛිත ප්‍රශ්න පත්‍රයක් සඳහාම නියමිත ලකුණුවලින් යටත් පිරිසෙයින් 40%ක් හෝ ඊට වැඩි ලකුණු ලැබූ අයදුම්කරුවන් අතුරින් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවා එහිදී මූලික සුදුසුකම් සපුරා ඇති බවට තහවුරු කෙරෙන අයදුම්කරුවන් පත් කිරීම සඳහා තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.

සැලකිය යුතුයි :-

හුදෙක් සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

11.3. විභාගයට පෙනී සිටි සියලු අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දැනුම්දීම විභාග කොමසාරිස් ජනරාල් විසින් තැපෑලෙන් හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය මගින් හෝ සිදුකරනු ලැබේ.

12. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය.

2021 ජූලි මස 30 වැනි දින,
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ දී ය.

07-754

---

## දීප ව්‍යාප්ත සේවාවන් සහ රාජ්‍ය සේවයේ විධායක ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවාගැනීමේ පොදු තරග විභාගය - 2021

ඉහත විභාගය සඳහා අයදුම්පත් කැඳවමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2237 දරන හා 2021.07.16 දිනැති *ගැසට්පත්‍රයේ* පළකරන ලද 2021.07.15 දිනැති **සිංහල භාෂා** නිවේදනයේ පහත සංශෝධන සිදුවිය යුතු බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි දන්වමි.

| *වගන්තිය* | *සංශෝධනය* |
|---|---|
| පූර්විකාව | දෙවැනි ඡේදයේ අවසාන වාක්‍ය පහත පරිදි සංශෝධනය විය යුතුය.<br>"අයදුම්පත් 2021 ජූලි 17 සිට **2021 අගෝස්තු 23 දින පැය 24:00 දක්වා** යොමු කළ හැකි වේ. |
| 1 | පළමු වාක්‍යය පහත පරිදි සංශෝධනය විය යුතුය.<br>"මෙම විභාගයේ පළමු (පොදු) කොටස රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන නියමයන්ට යටත්ව, විභාග කොමසාරිස් ජනරාල් විසින් **2021 සැප්තැම්බර් හෝ ඔක්තෝබර් මස** කොළඹ දී පමණක් පවත්වනු ඇත.'' |
| 6. (ආ) I | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2233/19 දරන හා 2021.06.22 දිනැති *ගැසට් පත්‍රයේ* පළකරන ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ 05 වැනි සංශෝධනයට අනුව ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය සඳහා බඳවා ගැනීමට අදාළ වන වයස් සීමාව පහත පරිදි සංශෝධනය විය යුතුය.<br>"අයදුම්පත් කැඳවීමේ නිවේදනය *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරන දිනට (2021.07.16) වයස අවුරුදු විසිදෙක (22) ට නොඅඩු විය යුතු අතර **අවුරුදු තිස්පහ (35)** ට නොවැඩි විය යුතුය.'' |

| වගන්තිය | සංශෝධනය |
|---|---|
| 6. (ආ) II | අනු අංක 2. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ අධ්‍යාපන සුදුසුකම් යටතේ (iii) උපවගන්තියේ "ආයතනික අදියර II විභාගය'' යන්න "**ආයතනික අදියර විභාගය**'' ලෙස සංශෝධනය විය යුතුය. |
| 6. (ආ) III - අනු අංක 2 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) හා සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ) යන තනතුරු දෙකෙහිම අධ්‍යාපන සුදුසුකම්වල අංක IV පහත පරිදි සංශෝධනය විය යුතුය.<br>"IV ජෛවීය විද්‍යා විද්‍යාවේදී උපාධිය හෝ **කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී සිව් අවුරුදු උපාධියක්** සමඟ ඉහත කුමන හෝ විෂයයක පශ්චාත් උපාධියක් ලබා තිබීම'' |
| 6. (ආ) III - අනු අංක 3 | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ තනතුර හි අධ්‍යාපන සුදුසුකම්වලට පහත අංක II එකතුවිය යුතුය.<br>"II **ඉහත කුමන හෝ විෂයයක් ප්‍රධාන විෂයය වූ පන්ති සාමාර්ථයක් සහිත විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය**'' |
| 6. (ආ) III - අනු අංක 4 | රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ සහකාර රජයේ රස පරීක්ෂක තනතුරහි සුදුසුකම් පහත පරිදි සංශෝධනය විය යුතුය.<br>"I. රසායන විද්‍යාව, **ජෛව රසායන විද්‍යාව, අණුක ජීව විද්‍යාව** හෝ **රසායන තාක්ෂණය** යන විෂයයන්ගෙන් එක් විෂයයක පන්ති සාමාර්ථයක් සහිත විද්‍යාවේදී විශේෂ උපාධිය, හෝ<br>II. **ඉහත කුමන හෝ විෂයයක** විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ **ඉහත කුමන හෝ විෂයයක්** ප්‍රධාන විෂයයවූ විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය සමඟ ජෛවරසායන විද්‍යාව, අණුක ජීව විද්‍යාව, විශ්ලේෂණ රසායන විද්‍යාව හෝ ව්‍යෝහාරික රසායන විද්‍යාව/ව්‍යෝහාරික විද්‍යව පශ්චාත් උපාධියක් ලබා තිබීම.<br>"රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ සැකකටයුතු ලේඛන පිළිබඳ සහකාර පරීක්ෂක තනතුරහි අංක III සුදුසුකම පහත පරිදි සංශෝධනය විය යුතුය.<br>"අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ විද්‍යා විෂය ධාරාව යටතේ විශ්වවිද්‍යාලයට ඇතුළත්ව පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය හෝ තොරතුරු පද්ධති යන විෂයයන්ගෙ න් එක් විෂයයක **පළමු හෝ දෙවැනි පන්තියේ** සාමාර්ථයක් සහිත විද්‍යාවේදී විශේෂ උපාධිය, හෝ'' |
| 6. (ආ) III - අනු අංක 5 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ තනතුරහි අධ්‍යාපන සුදුසුකම්වලට V උපවගන්තිය පහත පරිදි සංශෝධනය කිරීම හා පහත උපවගන්ති VII ඇතුළු කිරීම.<br><br>'' V ජෛවීය විද්‍යා විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ සාමාන්‍ය උපාධිය හෝ **කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී සිව් අවුරුදු උපාධිය සමග ඉහත IV හි සඳහන් විෂයයක පශ්චාත් උපාධිය හෝ''**<br><br>**''VII සත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව හා ජීව විද්‍යාව යන විෂයයන්ගෙන් අවම වශයෙන් විෂයයන් දෙකක් ප්‍රධාන විෂයයන් වූ පන්ති සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය''** |
| 6. (ආ) III - අනු අංක 6 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර වන සංරක්ෂක තනතුරහි අධ්‍යාපන සුදුසුකම්වල II හා V උපවගන්තිය පහත පරිදි සංශෝධනය කිරීම.<br><br>''II පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී වන විද්‍යා **හෝ පාරිසරික විද්‍යා උපාධිය**''<br><br>''V ජෛවීය විද්‍යා විද්‍යාවේදී උපාධිය හෝ **කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී සිව් අවුරුදු උපාධිය** සමග වන විද්‍යා, උද්භිද විද්‍යා, ජීව විද්‍යා, කෘෂිකර්ම, පරිසර විද්‍යා හෝ වැවිලි කළමනාකරණ පශ්චාත් උපාධියක් ලබා තිබීම'' |
| 6. (ආ) III - අනු අංක 9 | උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධන ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ තනතුරෙහි අංක IV සුදුසුකම පහත පරිදි සංශෝධනය විය යුතුය.<br><br>''IV ජෛවීය විද්‍යා විද්‍යාවේදී උපාධිය හෝ **කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී සිව් අවුරුදු උපාධියක්** සමග ඉහත කුමන හෝ විෂයයක පශ්චාත් උපාධියක් ලබා තිබීම'' |
| 6. (ආ) III - අනු අංක 10 | සෞඛ්‍ය අමාත්‍යාංශයේ පර්යේෂණ නිලධාරි (කීට විද්‍යා) සහ කීට විද්‍යාඥ තනතුරු සඳහා වූ අධ්‍යාපන සුදුසුකම්වල I උප වගන්තියේ ''කීට විද්‍යාව විෂයක් වශයෙන්'' යන්න ''**කීට විද්‍යාව විශේෂිත විෂයක වශයෙන්**'' ලෙස නිවැරදි විය යුතුය. |

2. අයදුම්පත් භාරගැනීම 2021 අගෝස්තු 23 දින පැය 24:00 දක්වා සිදුවනු ඇත.

3. මුල් නිවේදනයට අනුව 2021 ජූලි 31 දින දක්වා අයදුම්පත් සඳහා විභාග ගාස්තු ගෙවා ඇති කිසියම් අයදුම්කරුවකුට තමන් විසින් සේවාවලට/ සේවාවක තනතුරුවලට ලබා දී ඇති මනාප අනුපිළිවෙල මෙම සංශෝධනය අනුව වෙනස් කිරීමට අවශ්‍ය වේ නම් ඒ සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළකර ඇති www.doenets.lk/downloads දිගුව හරහා මනාප සංශෝධනය කිරීමේ අයදුම්පත බාගතකර, නිසි පරිදි සම්පූර්ණකර අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල් වෙත ලැබෙන පරිදි, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හා slexamcomp@gmail.com යන විද්‍යුත් ලිපිනයට යොමුකළ යුතුය.. ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ"දීප ව්‍යාප්ත සේවාවන් සහ රාජ්‍ය සේවයේ විධායක ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ පොදු තරග විභාගය - 2021 - මනාප සංශෝධනය" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

සටහන : මනාප සංශෝධනය කිරීමේ අයදුම්පතේ මුද්‍රිත පිටපත ලියාපදිංචි තැපැල් මගින් එවීම අනිවාර්යවේ. මුද්‍රිත පිටපත තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. මනාප සංශෝධනය කිරීමේ අයදුම්පත විද්‍යුත් ලිපිනයෙන් ඉදිරිපත් කර තිබුණද, එහි මුද්‍රිත පිටපත නියමිත දිනට විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත්ව නොමැති අවස්ථාවකදී, මුල් අයදුම්පතහි මනාප අනුපිළිවෙල තවදුරටත් වලංගු ලෙස සලකා කටයුතු කරනු ඇත.

4. මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු අවශ්‍ය වේ නම් වැඩකරන දිනවල කාර්යාලයීය වේලාව තුළදී දුරකතන අංක 011 2136607 අමතා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පත්වීම්) වෙතින් විමසීමක් කළ හැකිය.

එම්. ඒ. බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

07-755

---

**කම්කරු අමාත්‍යාංශය**

කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයේ ලඝු ලේඛක (සිංහල) III ශ්‍රේණිය තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021

අංක 2234 දරන 2021.06.25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයේ ලඝු ලේඛක (සිංහල) III ශ්‍රේණිය තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021 විභාග නිවේදනය හා බැඳේ.

එම නිවේදනය පහත පරිදි සංශෝධනය කරමි.

සංශෝධනය

කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයේ ලඝු ලේඛක (සිංහල) III ශ්‍රේණිය තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021 සඳහා අයදුම්පත් කැඳවමින්, පළ කරනු ලැබූ උක්ත ගැසට් නිවේදනයේ 05 (5.7) වගන්තියේ සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 2021.08.09 දක්වා දීර්ඝ කර ඇති බව මෙයින් දන්වමි.

තවද, එම නිවේදනයේ 05 වගන්තියේ සඳහන් උපරිම වයස් සීමාවන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන 2021.08.09 දිනට බලපැවැත්වෙන පරිදි වෙනස් විය යුතුය.

එම්. පී. ඩී. යූ. කේ. මාපා පතිරණ,
ලේකම්,
කම්කරු අමාත්‍යාංශය.

2021 ජූලි මස 28 වැනි දින,
කම්කරු අමාත්‍යාංශය.

08-99

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.